1. **ප්‍රතිපත්තියේ නම** : ජාතික ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය
2. **ක්‍රියාත්මක වන දිනය (ඉලක්කය)** : 2024 මාර්තු
3. **හැඳින්වීම**

## I. පසුබිම

දිවයින පුරා ගංගාද්‍රෝණි 103 අතරින් ගංගා 18 පමණ ජලය වර්ෂය මුළුල්ලේ පවතින අතර ඉතිරිය සෘතුමය වශයෙන් ජලය ගලා බසින ගංගා වේ. රට තුළ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය වියළි කලාපයේ 900mm සිට තෙත් කලාපයේ 5000mm දක්වා විචලනය වේ. මෙය ජල වාණිජකරණය සහ අපවිත්‍රකරණය සමග එක්ව කලින් කල ජල හිඟයන් ඇති වීමට මග පාදන බැවින් පරිභෝජනය සඳහා ජලය සැපයීම සමානාත්මතාව සිදු නොවීමට හේතු වේ. වර්තමානයේ ජනගහනයෙන් 60% පමණ නල ජල පහසුකම් පවතින අතර සෙසු ජනතාව ජල පහසුකම් සලසා ගන්නේ ආරක්ෂිත ළිං, වැසි ජල රැස්කිරීමේ පද්ධති සහ විවිධ ස්වාභාවික ජල මූලාශ්‍ර මගිනි. කෙසේ වුවත් අතීසාරය, කොලරා, අනෙකුත් පාචන රෝග, හෙපටයිටිස් A සහ B සහ උණ සන්නිපාත වැනි ජලයෙන් බෝවන රෝග තත්ත්වයන් වලින් වර පැතිරෙන බැවින් ජල ආරක්ෂණය තහවුරු කර ගැනීම සඳහා විශ්වාසනීය හා විධිමත් ප්‍රවේශයක අවශ්‍යතාව මතුවී පෙනේ. එම නිසා ප්‍රජාවගේ පරිභරණය සඳහා පවත්නා සීමිත පානීය ජලය, ආරක්ෂිතව කළමණාකරණය හා තිරසරභාවය රැක ගැනීම උදෙසා ජල ආරක්ෂණ සැලසුම් මෙවලමක් ලෙස හඳුනාගෙන තිබේ.

ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය (https://www.who.int/publications-detail-redirect/9789240067691) මනා කළමනාකරණ භාවිතයන්ගෙන් පෝෂිත වූ ඉතිහාසයක් මත ගොඩනංවා ඇති අතර ජල පෝෂක ප්‍රදේශයේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා ජල සම්පාදන පද්ධතියේ සියළුම අදියරයන්හි අවදානම් අවම කරනු පිණිස නිර්මාණය කර ඇත. ආරක්ෂිත ජලය බෙදා හැරීම සහතික කිරීම සඳහා මෙවලමක් ලෙස ක්‍රියාකරමින්, බහු-බාධක ප්‍රවේශය අනුගමනය කරමින් විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන්හි ප්‍රධාන ප්‍රතිපත්ති සහ සංකල්ප මෙම ජල ආරක්ෂණ සැලැස්ම විසින් භාවිත කරනු ලැබේ.

තීරණාත්මක සෞඛ්‍ය ගැටළු බවට පත් වීමට පෙර දේශගුණික විපර්යාස සහ ආපදා සම්බන්ධ අවදානම් ඇතුළුව පානීය ජල ආරක්ෂාව සඳහා තිබෙන්නාවූ විභව අවදානම්, පෙර සිටම හඳුනා ගැනීම, ප්‍රමුඛතාකරණය සහ විධිමත් කළමනාකරණය ජල ආරක්ෂණ සැලැස්මේ ප්‍රවේශයට මූලිකවම අවශ්‍ය වේ. ජල ආරක්ෂණ සැලසුම් ප්‍රවේශය, පානීය ජල සැපයුම් කළමනාකරණය මගින් මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ වඩාත් ඵලදායී උපාය මාර්ග වශයෙන් බහුලව පිළිගෙන ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥ මාර්ගෝපදේශ යටතේ 2013 වසරේ ශ්‍රී ලංකාව විසින් ජල ආරක්ෂණ සැලැස්ම අනුගත කර ගැනීම, රටේ ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය ලබාදීම සහතික කරනු සඳහා රටේ පූර්ව කැපවීමේ ආරම්භය පෙන්නුම් කරයි. මනා ජාත්‍යන්තර භාවිතයන් සමඟ මෙම සාමූහික ප්‍රයත්නය සමගාමී වන අතර මෙමගින් ජල ආරක්ෂණ කළමනාකරණ සහ මහජන සෞඛ්‍ය ආරක්ෂක ක්ෂේත්‍රයේ පෙරමුණ ගන්නා ශ්‍රී ලංකාවේ ස්ථානය වඩාත් ශක්තිමත් වේ. වර්ෂ 2023 අවසාන වන විට, රට පුරා නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම 95%ට වඩා ජල ආරක්ෂණ සැලැස්ම සමඟ ඒකාබද්ධ වනු ඇත. තවද ජල ආරක්ෂණ සැලැස්ම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම රාශියකට ඒකාබද්ධ කිරීමටද ඇපකැප වූ උත්සාහයන් දරමින් සිටී.

ඒ හා සමගාමීව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සමානාත්මතාවය සහ දේශගුණික විපර්යාසයන්ට අනුගත වීම පිළිබඳ සලකා බැලීම ද ජල ආරක්ෂණ සැලැස්මේ ප්‍රවේශයට ඒකාබද්ධ කර ඇත. මෙම

අංශ මගින් දේශගුණික විපර්යාසයන් හා ආපදා හේතුවෙන් ඇතිවිය හැකි අනාගත අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද සියළුම පාරිභෝගිකයන් හට ආරක්ෂාකාරීව කළමනාකරණය කරන ලද දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන පානීය ජල සම්පාදන පද්ධතීන් වෙත ප්‍රවේශ වීම සඳහා සහාය සැපයේ.

ජාතික ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාව තුළ ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ අර්ථදක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය බලය ලබාදීම අරමුණු කොට තිබේ.

## II. අවශ්‍යතාවය

නාගරික හා ග්‍රාමීය නල ජලය, බවුසර් මගින් සැපයෙන ජලය, පටල පවිත්‍රිත ජලය (membrane treated), බෝතල් කල ජලය, වෙනත් විශේෂිත සැපයුම්කරුවන්, ජල විකුණුම්කරුවන්, වැසි ජලය සහ අනෙක් ස්ථානීය ජල මූලාශ්‍ර පරිශීලකයන් ඇතුලත්ව පානීය ජලයට අදාල ජල සුරක්ෂිතතාවය පිළිබඳ පුළුල් ආවරණයක් සහතික කිරීම සඳහාත් ජාතික ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ පූර්ව අත්දැකීම්වලින් රැස්කර ගත් අවබෝධයන් මත පදනම්ව ශක්තිමත් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම හරහා ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවට පැහැදිලි වී ඇත. එවැනි ප්‍රතිපත්තියක් මගින් වඩාත් ඵලදායී සහ බද්ධවූ ප්‍රවේශයක් සහතික කරමින්, ගතයුතු පියවරයන් හා ක්‍රියාකාරී රාමුව සරලදායී හා ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. ජල ආරක්ෂණ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය සහ පවත්නා අඩුපාඩු කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කරන ලද විස්තීර්ණ සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ විශේෂිත වූ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි සැපවූ ජල ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව තවදුරටත් අවධාරණය වී ඇත.

තවද, ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ සහ අනුගතවීමේ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා එවැනි ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

## III. අරමුණු සහ සන්දර්භය

මෙම ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය වන්නේ ජල ආරක්ෂණ සැලසුම බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය සහය සපයන ශක්තිමත් හා බලයලත් රාමුවක් ස්ථාපනය කිරීමයි. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් යෝජනා කරන ලද සහ ලොව පුරා පුළුල් ලෙස සම්මත කර ඇති පරිදි පානීය ජලයේ ගුණාත්මකභාවය, පිළිගතහැකිභාවය සහ ප්‍රමාණාත්මකතාව සහතික කිරීමේ තීරණාත්මක මෙවලමක් ලෙස ජල ආරක්ෂණ සැලසුම පිළිගැනීමේ ගෝලීය සන්දර්භය තුල මෙම අවශ්‍යතාවය පැන නගී. ශ්‍රී ලංකාවේ විශේෂිත සන්දර්භය තුල ජල ආරක්ෂණ සැලසුම් භාවිතයන් වැලඳගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රටේ ක්‍රියාකාරී ස්ථාවරය පිළිගනිමින් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජල ආරක්ෂණ සැලසුම් පුහුණු වැඩසටහන දකුණු ආසියාතු කලාපයට ව්‍යාප්ත කර ඇත.

තවද, ශ්‍රී ලංකාව ජල ආරක්ෂණ සැලසුම් පිළිවෙත් සමුදාය කඩිනමින් අනුගමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළ, දකුණු සහ අග්නිදිග ආසියාවේ කලාපීය සගයන් හා සැසඳීමේදී ජල ආරක්ෂණ සැලසුම් භාවිතයේ ප්‍රශංසනීය මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ඇති අතර කැපී පෙනෙන ලෙස කෙටි කාල රාමුවක් තුල විශාල අනුකූලතාවයද ලබා ඇත. මෙම පසුතිරයට එරෙහිව, ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම

සහතික කිරීම සහ ජල ආරක්ෂණ පියවරයන් පුළුල් ලෙස යෙදවීමේ පුමුඛයා ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ ජල ආරක්ෂණ සැලසුම් රාමුව වැඩිදියුණු කිරීමට මෙම ප්‍රතිපත්තිය මඟින් වැයම් දරනු ලැබේ.

## IV. තාර්කිකකරණය

ජල ආරක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම අත්‍යවශ්‍ය වන අතර එය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම පිණිස පුළුල් ප්‍රතිපත්ති රාමුවක දැඩි අවශ්‍යතාවයකින් මෙහෙයවනු ලැබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පානීය ජල තත්ව මාර්ගෝපදේශවල තුන්වන සහ සිව්වන සංශෝධන මඟින් ජල ආරක්ෂණ සැලසුම් ප්‍රතිපත්තිය හඳුනාගෙන ඇත්තේ විශාල ජල සැපයුම්කරුවන්ට පමණක් නොව පානීය ජල සුරක්ෂිතතාවය අඛණ්ඩව සහතික කිරීම සඳහා ස්ථානීය මූලාශ්‍ර පරිශීලකයන්ට ද ක්‍රියාත්මක කළ හැකි නම්‍යශීලී සහ අනුකූල විය හැකි මෙවලමක් ලෙසය. මෙම ජල ආරක්ෂණ සැලසුම් ප්‍රතිපත්තිය, ජල ආරක්ෂණ සැලසුම් මූලධර්මවලට අනුකූල වන අතර එමඟින් ජල ආරක්ෂණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී හඳුනාගත් ගැටළුවලට විසඳුම් සෙවීමට අපේක්ෂිතයි. එසේවුවද, ISO ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සාක්ෂි සහ ක්‍රියාපටිපාටි ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලියේදී සපුරාලන බැවින් ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම මඟින් ISO 9001:2015 ලබා ගැනීම සඳහා සහය දක්වනු ලැබේ.

වර්තමානයේ ජල ආරක්ෂණ සැලසුම් රාමුව නාගරික ජල සැපයුම් සඳහා පියවර 10ක ක්‍රියාවලියකින් සහ ග්‍රාමීය ජල සැපයුම් සඳහා සකස් කරන ලද සරලීකෘත පියවර 6ක ක්‍රියාවලියකින් සමන්විත වේ. ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය තුළ අන්තර්ගත වී ඇති අවදානම් අඩු කිරීමේ මූලික මූලධර්මයන්, ජල ආරක්ෂණ සැලසුම් පියවරයන් රටකට සුවිශේෂී වූ වෙනස්කම් කිරීමේදී අනුගමනය කළ යුතුයි. පානීය ජල සුරක්ෂිතතාවය සඳහා ක්‍රමානුකූල සහ සාකල්‍ය ප්‍රවේශයක් සහතික කරමින් ජල ආරක්ෂණ සැලසුමේ හි එක් එක් පියවර සලකා බලමින් සවිමත් රාමුවක් ස්ථාපිත කිරීම සඳහා තීරණාත්මක අවශ්‍යතාවය මෙම ප්‍රතිපත්තිය මඟින් ඉස්මතු කරනු ලැබේ.

එබැවින් අතීත ජල ආරක්ෂණ සැලසුම් අත්දැකීම්, විගණන ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාවය ඉස්මතු කිරීම සඳහා සිදුකරනු ලද අවශ්‍යතා - පරතර විශ්ලේෂණය පදනම් කරගෙන දැනට පවත්නා ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය සවිමත් කිරීම සඳහා උපායමාර්ගෝපදේශ විධිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය පසුපස ඇති අවශ්‍යතාවය වේ.

**4. ප්‍රතිපත්ති මූලධර්ම**

I. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් දක්වා ඇති ජල ආරක්ෂණ සැලසුම් අත්පොත 2වන සංස්කරණය පදනම් කොට (එනම් ජලයේ ගුණාත්මකභාවය, පිළිගතහැකිභාවය, ප්‍රමාණාත්මකතාවය, සමානාත්මකතාවය සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව), අදාළ සේවා සපයන්නන්, ජල විකුණුම්කරුවන්, පාරිභෝගිකයන් හා මූලාශ්‍ර පරිශීලකයන් සහ පාර්ශවකරුවන් විසින් ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය.

II. ප්‍රමාණවත් නොවන ජල පරිමාවන් සහිත ජල ප්‍රභව පාරිභෝගිකයන් ගුණාත්මක බවින් අඩු ජලය පරිහරණය කරා ගෙන යා හැකි අතර, එවැනි අවස්ථාවක අධිකතර හෝ ප්‍රමාණවත් නොවන ජල සම්පත් පැවතීම හෝ එවැනි ජල සම්පත් වෙත ප්‍රවේශවීම පිළිබඳව අර්බුධ පැනනැගීමට හැකි බැවින් ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය(IWRM) සමඟ සම්බන්ධවීම ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලියේදී ඉතා වැදගත් වේ.

III. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියේ ඇතුළත් කර ඇති මූලධර්ම ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය සඳහා කේන්ද්‍රීය වේ. එබැවින් ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය, ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය හි පුළුල් රාමුව යටතට ස්ථානගත කර ඇත.

IV. පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ හඳුනාගෙන ඇති මූලධර්ම ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා වැදගත් වේ.

V. ජලය සම්බන්ධ අවදානම් බොහොමයක් මිනිස් ක්‍රියාකාරකම් මගින් හටගන්නා බැවින් දැනුවත් කිරීම් අභිවර්ධනය මගින් ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමට ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය යටතේ ක්‍රියා කිරීම ඉතා තීරණාත්මක කාර්යයකි.

VI. ජල සම්පත්වල ගුණාත්මකභාවය, ප්‍රමාණාත්මකභාවය සහ පැතිරී ඇති ආකාරය කෙරෙහි දේශගුණික විපර්යාස මගින් බලපෑම් ඇති කරනු ලබමින් ජල හිඟතාව තීව්‍ර කිරීමට හේතු වන බැවින් ජලධාර වල පවතින ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය සංරක්ෂණය කිරීම වඩාත් වැදගත් වේ.

## 5. ප්‍රතිපත්ති ප්‍රකාශන

I. ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය මූලික වශයෙන් අඛණ්ඩ සමාලෝචනය සහ සංශෝධනය දැඩි ලෙස අවධාරණය කරමින් ජල ආරක්ෂණ සැලසුම් කණ්ඩායම් සකස් කිරීම, පද්ධතිය හඳුනා ගැනීම, පුළුල් අවදානම් තක්සේරුව, ඵලදායී අවදානම් අවම කිරීමේ උපාය මාර්ග, කාර්යක්ෂම පද්ධති කළමනාකරණය, සහ අධීක්ෂණය, දැඩි පද්ධති වලංගුකරණය, සත්‍යාපනය කිරීම මෙන්ම සාමාන්‍ය සහ හදිසි අවදස්ථාවලදී ක්‍රියාශීලී කළමනාකරණය සහ සහය දක්වන ක්‍රියාමාර්ග වැනි තීරණාත්මක අංග වලින් මූලික වශයෙන් සමන්විත වේ.

II. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශවලට අනුව ශ්‍රී ලංකාවේ ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමටද, නිරීක්ෂණය හා සත්‍යාපනය කිරීම පිණිසද මාර්ගෝපදේශ සැපයීම සඳහා ද වගකිවයුතු ප්‍රධාන ආයතන ලෙස ජල සම්පාදන, සෞඛ්‍ය, ජල සම්පත්, පරිසර, ඉඩම් සහ පළාත් පාලනය භාර රේඛීය අමාත්‍යාංශ වලට ප්‍රධාන භූමිකාවක් පවරනු ලැබේ.

III. සේවා සපයන්නන්, ජල විකුණුම්කරුවන්, පාරිභෝගිකයන් සහ ස්ථානීය ජල මූලාශ්‍ර පරිශීලකයන් සඳහා ජල ආරක්ෂණ සැලසුම් අනිවාර්යය කිරීම පිළිබඳව නියාමකයෙකු විසින් තීරණය කරනු ලබයි. නියාමකයකු නොමැති අවස්ථාවකදී, අදාළ සැපයුම්කරු හෝ පරිශීලක විසින් සම්බන්ධිත ප්‍රතිලාභ සහ පිරිවැය සාධාරණීකරණය කිරීම මත විධිමත් ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමක් තීරණය කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දින සිට, රේඛීය අමාත්‍යාංශය විසින් සඳහන් කරනු ලබන කාල රාමුවක් තුළ, උපරිම සතුටුදායක මට්ටමකට, ලෝක සෞඛ්‍ය සංවිධානය අත්පොත මගින් දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව ජල සැපයුම්කරු විසින් ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සම්පූර්ණ කළ යුතුය.

IV. ප්‍රතීතනය කරන ලද රසායනාගාර සහය සහිත ස්වාධීන බලධාරීන් විසින් ජල ආරක්ෂණ සැලසුම් ප්‍රතිපත්තිය නිරන්තරයෙන් සත්‍යාපනය කිරීම අත්‍යාවශ්‍ය කළමනාකරණ අවශ්‍යතාවයක් වන අතර එමඟින් එහි සඵලතාවය සහ ස්ථාපිත ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කෙරේ.

V. තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා සහය වන අතරම, ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය හරහා ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය මූලධර්ම පිළිපැදීම අවධාරණය කරමින් දේශගුණයට ඔරොත්තු දීමේ ක්‍රියාමාර්ග, ආපදා අවදානම අවම කිරීම, ආපදා පෙර සූදානම ඇතුළු ආපදා කළමනාකරණය සඳහා වන ක්‍රියාමාර්ග ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය මගින් ඒකාබද්ධ කරනු ලැබේ.

VI. ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය හි උප-ප්‍රතිපත්තියක් විය යුතුයි. ( ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය හි අයිතම 5 හා 6 යටතේ)

VII. ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ රාමුව දැනුවත් කිරීම සහ පුහුණු ක්‍රියාකාරකම් මඟින් ශක්තිමත් කළ යුතුයි. අවසාන පරිශීලකයින්ගේ පරිහරණ පිළිවෙත් පානීය ජලයේ

ආරක්ෂාව සඳහා බරපතල ප්‍රතිවිපාක ඇති කළ හැකි බැවින් අවසාන පරිශීලකයන්ගේ පිළිවෙත් සහ ගැටළු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

VIII. පානීය ජල සම්පාදනය සහ සේවාවය සඳහා වන රේඛීය අමාත්‍යාංශ යටතේ ජල ආරක්ෂණ සැලසුම් උපදේශනය සහ ධාරිතා ගොඩනැංවීම අඛණ්ඩව කරගෙන යා යුතුය.

IX. ජල ආරක්ෂණ සැලසුම් රාමුවට පාරිසරික අවශ්‍යතා සඳහා ජල ප්‍රවාහ සහ මූලාශ්‍රයේ ජලයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා යාන්ත්‍රණයන් ඇතුළත් විය යුතුය.

## 6. ප්‍රතිපත්ති ඉලක්ක

I. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පසුබිම් කොට ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ මූලධර්ම සමඟ සමපාත වූ සවිමත් ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපනය කිරීම මඟින් අඩුපාඩු මගහරවා ගැනීම සහතික කරමින් ශ්‍රී ලංකාවේ සියලු කලාප තුළ ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය පුළුල් හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

II. සමස්ත පද්ධතිය පුරාවට ජලයේ ගුණාත්මකභාවය දූෂණය වීමට සහ ජල ප්‍රමාණය ක්ෂය වීමට දායක වන මානව ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම් අවම කිරීම මඟින් විශ්වාසනීය සහ ආරක්ෂිත පානීය ජල සැපයුමක් ස්ථාපිත කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම.

III. පානීය ජල සැපයුම් පද්ධතිවල තිරසාර කළමනාකරණය සම්බන්ධයෙන් ජල මූලාශ්‍ර වලට අදාළව
දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ අනුගත වීම අරමුණු කරගත් වැඩපිළිවෙලවල් සඳහා අනුග්‍රහය දැක්වීම සහ අභිවර්ධනය කිරීම.

IV. අර්බුධකාරී සහ හදිසි අවස්ථාවලදී අවදානම් කළමණාකරණය කිරීම සහ සුරක්ෂිත පානීය ජලය අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා උපාය මාර්ගික ක්‍රියාමාර්ග සහ විධිමත් චර්යා සමුදායන් ක්‍රියාත්මක කිරීම තුළින් විශේෂයෙන් පානීය ජල කළමනාකරණ සන්දර්භය තුළ රටේ ආපදා සඳහා පෙර සූදානම් හැකියාවන් ශක්තිමත් කිරීම.

## 7. විෂයපථය සහ අදාලත්වය

ජල ආරක්ෂණ ප්‍රතිපත්තියේ විෂය පථය ජල පෝෂක ප්‍රදේශයෙන් ආරම්භ කර අවසානයේ පරිශීලකයින් විසින් පරිභෝජන ස්ථානය දක්වා ව්‍යාප්ත කරමින් සියළුම පානීය ජල සැපයුම් පද්ධති පුරා ජල ආරක්ෂණ සැලසුම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා සකස් කරන ලද රටට අදාල විශේෂිත රාමුවක් සවිස්තරාත්මකව ස්ථාපනය කිරීම ලෙස අර්ථ දැක්විය හැක. මෙම සාකල්‍ය ප්‍රවේශය සාමාන්‍ය හෝ හදිසි අවස්ථාද ආවරණය වන පරිදි සැපයුම්-දාමයේ සියළුම අදියරයයන් හරහා ජලයේ ගුණාත්මකභාවය සහ ප්‍රමාණාත්මකභාවය ප්‍රවේශමෙන් සහ නිරවද්‍ය ලෙස ආරක්ෂා කිරීම සහතික කිරීම අරමුණු කරයි.

[illegible]

## 5. [illegible]

[illegible] 16 [illegible]

සාමාන්‍යකරණය වූ ප්‍රමුඛත්වය සඳහා තාර්කික පදනමක් නොමැති බැවින් එක් එක් ජල සැපයුම් පද්ධතියේ අවශ්‍යතාවලට යටත්ව අදාල පාර්ශවකරුවන් හට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

වගුව 01 ජල ආරක්ෂණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රධාන උපාය මාර්ග

| අයිතම අංකය | අවශ්‍ය ක්‍රියාමාර්ගය | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයන් | වගකීම සහ බලධාරීත්වය | අධීක්ෂණය සහ ඇගයීම |
|---|---|---|---|---|
| 1. | අදාල පාර්ශවකරුවන්ගේ කාර්යභාරයන් සහ වගකීම් ගැසට් කිරීම. | පාර්ශවකරුවන්ගේ සාමූහික වගකීම සහතික කිරීම. | සෞඛ්‍ය, ජල සම්පාදන, පරිසර, මහවැලි, වාරිමාර්ග, පළාත් පාලන සහ පළාත් සභා ආපදා කළමනාකරණ සහ වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ රේඛීය අමාත්‍යාංශ, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මධ්‍යම පරිසර අධිකාරිය මධ්‍යම පරිසර අධිකාරිය සහ ජල සම්පත් මණ්ඩලය | ජල තත්ත්ව නිරීක්ෂණය සහ දිස්ත්‍රික්/පළාත් පරිසර කමිටු රැස්වීම් සහ ජල ආරක්ෂණ සැලසුම් සත්‍යාපනය, මධ්‍යම/ප්‍රාදේශීය ආපදා කළමනාකරණ රැස්වීම්, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හි ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |
| 2. | සියලුම සංවර්ධන කටයුතුවලදී අන්තර්ගත විය යුතු ජාතික ප්‍රමුඛතාවයක් ලෙස ජල ආරක්ෂණ සැලසුම් යෙදවීම ප්‍රකාශයට පත් කිරීම. සියලුම ජල සම්පාදන ආයතනවල ජල ආරක්ෂණ සැලසුම් යෙදවීම වැදගත් ප්‍රධාන කටයුත්තක් ලෙස සැලකීම. | අදාල ආයතනවල ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම හා දැනුවත්භාවය ඉහළ නැංවීම ධෛර්යමත් කිරීම. | මුදල්, පළාත් සභා හා පළාත් පාලන, සෞඛ්‍ය, පරිසරය සහ ජල සම්පාදන විෂයභාර අමාත්‍යාංශයන් | ජාතික හා කලාප සංවර්ධන සැලසුම්, ආයතනික සැලසුම් ප්‍රධාන කාර්ය සාධක දර්ශක, ව්‍යාපෘති වාර්තා පාරිසරික බලපෑම් තක්සේරුව ආදිය |

| අයිතම අංකය | අවශ්‍ය ක්‍රියාමාර්ගය | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයන් | වගකීම සහ බලධාරීත්වය | අධීක්ෂණය සහ ඇගයීම |
|---|---|---|---|---|
| 3. | ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාවලිය පිළිබඳ උපදේශනය, ධාරිතා සංවර්ධනය, පුහුණුව සහ දැනුවත් කිරීම | ජල ආරක්ෂණ සැලසුම් කණ්ඩායම් සාමාජිකයන්ගේ තාක්ෂණික දැනුම, හා අත්දැකීම් වැඩි දියුණු කිරීම. | ජලසම්පාදන සහ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ | ජාතික සහ ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්,ආයතනික සැලසුම් ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
| 4 | අදාල භාරකරු, මූලාශ්‍ර - පාදක ආරක්ෂණ ක්‍රම සහ රෙගුලාසි යටතේ පාරිසරික වශයෙන් වඩාත්ම සංවේදී කලාප ලෙස ජලය ලබාගන්නා ප්‍රදේශවලට ආසන්න වපසරිය ගැසට් කිරීම. | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සහ ඉඩම් පරිහරණ කළමනාකරණය ක්‍රියාත්මක කිරීම. | පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව ඇතුළුව ඉඩම් අමාත්‍යාංශය. | පළාත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සහ ජල ආරක්ෂණ සැලසුම් සත්‍යාපනය කිරීම,දිස්ත්‍රික් පරිසර කමිටු බලගැන්වීම. |
| 5. | පවතින හා මතුවන අවදානම් සඳහා නියාමන ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ පවතින ප්‍රමිතීන් බලාත්මක කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය මඟින් මූලාශ්‍ර ජලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පානීය ජලය සඳහා නියාමන ප්‍රමිතීන් පවත්වා ගෙන යෑම. | සෞඛ්‍ය අමාත්‍යාංශය, ජලසම්පාදනය භාර අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, සහ මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය | ජාතික සහ පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ජල තත්ත්ව ආවේක්ෂණ රැස්වීම, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව මධ්‍යම පරිසර අධිකාරිය, ජල ආරක්ෂණ සැලසුම් සත්‍යාපනය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 6. | ආරක්ෂිත පානීය ජලය සඳහා ඇති ප්‍රවේශය සහතික කරමින් ජාතික පානීය ජල ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයක් ලෙස ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම හඳුනා ගැනීම | උපද්‍රව සහ අනතුරුදායක සිදුවීම් තක්සේරු කිරීම සහ ඒවා පාලනය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සහය ලබා ගැනීම | සෞඛ්‍ය අමාත්‍යාංශය, ජල සම්පාදනය භාර අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන (පළාත්පාලන හා පළාත්සභා අමාත්‍යාංශය) මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, පරමාණුක බලශක්ති අධිකාරිය. අදාළ පරිදි ජලයට අදාල භාරකරුවන් (මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ආදිය) | සෞඛ්‍ය අමාත්‍යාංශය, ජල සම්පාදනය භාර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන සහ අදාල පාර්ශවකරුවන් සමඟ පවත්වනු ලබන ජල තත්ව ආවේක්ෂණ කමිටු රැස්වීම |

| අයිතම අංකය | අවශ්‍ය ක්‍රියාමාර්ගය | ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයන් | වගකීම සහ බලධාරීත්වය | අධීක්ෂණය සහ ඇගයීම |
|---|---|---|---|---|
| 7 | ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලයේ ජලයේ ගුණාත්මකභාවය සහ ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ මධ්‍යගත දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම. අවදානම් කළමනාකරණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය | දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් ඇතුළුව උපද්‍රව හඳුනාගැනීම සහ අවදානම් තක්සේරු කිරීම සඳහා දත්තගබඩාවක් ස්ථාපනය කිරීම. | පරිසර අමාත්‍යාංශය, ජල සම්පාදනය භාර අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය | ජලයේ ගුණාත්මකභාවය ආවේක්ෂණය කිරීමේ රැස්වීම, පළාත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම, ජල ආරක්ෂණ සැලසුම් සත්‍යාපනය කිරීම, සෞඛ්‍ය අමාත්‍යාංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය |
| 8 | ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය යටතේ ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සත්‍යාපනය කිරීම සඳහා නියාමන ආයතනය ලෙස ස්වාධීන ආයතනයක් සංවර්ධනය කිරීම. සියලුම රාජ්‍ය සහ පෞද්ගලික පානීය ජල සැපයුම්කරුවන් අවම වශයෙන් වසරකට දෙවරක්වත් ජල තත්ත්ව පරීක්ෂණ ඔස්සේ තම ජල සුරක්ෂිතතා සැලැස්ම සත්‍යාපනය කර ගනු ලැබීමට සැලැස්වීම. | ජල ආරක්ෂණ සැලසුම් වල ක්‍රියාත්මක යෙදවීම සඳහා නියාමන නියෝජිතායතනයක ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම | ජල සම්පාදනයට අදාළ අමාත්‍යාංශය, , සෞඛ්‍ය අමාත්‍යාංශය සහ නියාමන නියෝජිතායතනය | ජලයේ ගුණාත්මකභාවය ආවේක්ෂණය කිරීමේ රැස්වීම, ජාතික මට්ටමේ අදාළ අධ්‍යක්ෂක සහ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සහ ජල ආරක්ෂණ සැලැස්මේ සත්‍යාපනයන් |

| | | | | |
|---|---|---|---|---|
| 9 | දේශගුණයට ඔරොත්තුදෙන ජල ආරක්ෂණ සැලසුම් ජාතික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනා ගැනීම. | දේශගුණයට ඔරොත්තුදෙන ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. | දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය, ජල සම්පාදනය භාර අමාත්‍යාංශය, ජාතික සැලසුම් අමාත්‍යාංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, | ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව දර්ශක (NDCS), ජල සැපයුම්කරුවන්ගේ ආයතනික සැලසුම්, ආපදා කළමණාකරණ සැලසුම, ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල ආරක්ෂණ සැලසුම් උපදේශන ඒකකය, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, |
| 10 | අනාගත ව්‍යාපෘති සැලසුම්කරණය සහ ඇගයීම සඳහා ජාතික මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම | කාලගුණික අනුවර්තනයන් සඳහා ජාතික මූලිකත්ව තත්වය ලබා කර ගැනීම. | පරිසර අමාත්‍යාංශය, , ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, | ව්‍යාපෘති ඇගයීම් වාර්තා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය |

සම්බන්ධ ප්‍රතිපත්ති ලැයිස්තුව

1. ජාතික පානීය ජල ප්‍රතිපත්තිය (2024)
2. ජාතික සනීපාරක්ෂක ප්‍රතිපත්තිය
3. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය
4. ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර,ඒවායේ ජල පෝෂක සහ රක්ෂිතයන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය(2014)
5. ජාතික වැසිජල ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග(2005)
6. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ආයතනික විධිවිධාන (2000)
7. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය සඳහා ජාතික ප්‍රතිපත්තිය
8. ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය
9. ජාතික ජෛව සුරක්ෂිතතා ප්‍රතිපත්තිය (2005)
10. ජාතික ධීවර සහ සහ ජලජ සම්පත් ප්‍රතිපත්තිය (2006)
11. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය
12. ජාතික ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ප්‍රතිපත්තිය (2004)
13. තෙත් බිම් පිළිබද ජාතික ප්‍රතිපත්තිය
14. ජාතික වන සංරක්ෂණ ප්‍රතිපත්තිය
15. වන ජීවීන් පිළිබද ජාතික ප්‍රතිපත්තිය
16. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම - 2030
17. අධි- දූෂක කර්මාන්ත ස්ථානගත කිරීම.
18. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ගය
19. ජාතික වැව්ලි කර්මාන්ත ප්‍රතිපත්ති රාමුව
20. ආපදා කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තිය (2013)
21. ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය (2012)
22. ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස අනුවර්තන උපාය මාර්ගය
23. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය (2023)

කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| CEA | - | මධ්‍යම පරිසර අධිකාරිය |
| EIA | - | පාරිසරික බලපැම් තක්සේරුව |
| HACCP | - | උපක්‍රම විශ්ලේෂණය නිරීක්ෂණාත්මක පාලක ස්ථානය |
| IDMP | - | ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම |
| IWRM | - | ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය |
| KPIs | - | ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
| NDCs | - | ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව දර්ශකය |
| DNCWS | - | ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව |
| NWRP | - | ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය |
| NWRS | - | ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය |
| NWSDB | - | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| WHO | - | ලෝක සෞඛ්‍ය සංවිධානය |
| WSP | - | ජල ආරක්ෂණ සැලැස්ම |